# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9/2018 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.09.19 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 09-2018**

දකුණු පළාත් සභාවේ
සියළුම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්,
ගණන්දීමේ නිලධාරීන් හා ව්‍යවස්ථාපිත අධිකාරී ප්‍රධානීන් වෙත,

**2018.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවා ගාස්තු සහ කොන්ත්‍රාත් ගෙවීම් වලින් රඳවා ගැනීමේ බදු අඩුකිරීම .**

උක්ත මැයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පළකර ඇති අංක-Sec/2018/06 හා 2018.04.18 දිනැති චක්‍රලේඛයට අදාළව අවශ්‍ය පැහැදිලි කිරීම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් අංක ACT/4/22/2 හා 2018.08.16 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇත.(එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.)

ඒ අනුව 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ සඳහන් වගන්ති අංක 85 හා 84 ට අනුව රඳවා ගැනීමේ බදු අඩු කළ යුත්තේ, රඳවා ගැනීමේ අනුයෝජිතයා විසින් බවත් **"රඳවා ගැනීමේ අනුයෝජිතයා"** යන්නෙන් මෙම පනත යටතේ, යම් ගෙවීමකින් බදු රඳවා ගැනීමට නියම කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වන බවත් සඳහන් කර ඇත.

තවද, 195 වගන්ති ප්‍රකාරව **"තැනැත්තා"** යන්නෙන් පුද්ගලයකු හෝ අස්ථිත්වයක් අදහස් වන අතර, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්,පොල්ම:කරුවෙක්,රාජ්‍ය නොවන සංවිධානයක් සහ පුණ්‍යායතනයක් ඊට ඇතුලත් වන බව වැඩිදුරටත් සඳහන් කර ඇත.එසේම ඉහත අර්ථ දැක්වීම වලට අනුව රජයට අයත් ආයතන ඇතුලත් නොවන බව ද දැනුම් දී ඇත.

ඒ අනුව මෙම පනතට අදාළව අර්ථ දැක්වීම් වලට අනුව දකුණු පළාත් සභාවේ ව්‍යවස්ථාපිත අධිකාරි ආයතන විසින් මෙම චක්‍රලේඛයට අනුව 2018.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රඳවා ගැනීම් බදු අනුයෝජිතයා ලෙස ලියාපදිංචි වීම හා සේවා ගාස්තු සහ කොන්ත්‍රාත් ගෙවීම් වලින් රඳවා ගැනීමේ බදු අඩුකිරීම සම්බන්ධව කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වමි.

ආර්.සී.ද.සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**පිටපත්**

01. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්,දේශීය ආදායම් දෙපාර්තමේන්තුව. : දැ.ගැ.ස.
02. සහකාර විගණකාධිපති - දකුණු පළාත : දැ.ගැ.ස.
03. අධ්‍යක්ෂ, දකුණු පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව : දැ.ගැ.ස.
04. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත : දැ.ගැ.ස.
05. අයවැය අධ්‍යක්ෂ, දකුණු පළාත :දැ.ගැ.ස.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
## உள்நாட்டு இறைவரித் திணைக்களம்
## DEPARTMENT OF INLAND REVENUE

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515. கொழும்பு -2. இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011-2338574/ 2338659/ 2338635/ 2338570/ 2338543

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135402/ 2135410/ 2135412 / 2135413/ 20135411

E-Mail – secretariat@ird.gov.lk
Web: www.ird.gov.lk


මගේ අංකය: ACT/4/22/2

2018.08.16

ලැබුණා
07 SEP 2018
ප්‍රධාන ලේකම් දකුණු පළාත
DF

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය-දකුණු පළාත,
එස්.එච්.දහනායක මාවත,
ගාල්ල.

<u>රඳවා ගැනීමේ බද්ද අඩු කිරිම සම්බන්ධවයි</u>

ඉහත කරුණ සම්බන්ධව දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ඔබගේ 2018.07.30 දිනැති ලිපිය හා බැඳේ.

2017 අංක 24 දරණ දේශිය ආදායම් පනතේ 85 හා 84 වගන්ති යටතේ නිකුත් කරන ලද, 2018.04.18 දිනැති චක්‍රලේඛ අංක.SEC/2018/06 අනුව, රඳවා ගැනීමේ බදු අඩු කල යුත්තේ, රඳවා ගැනීමේ අනුයෝජිතයා විසිනි.

ඒ අනුව, **"රඳවා ගැනීමේ අනුයෝජිතයා"** යන්නෙන්, මෙම පනත යටතේ යම් ගෙවීමකින් බදු රඳවා ගැනීමට නියම කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ.

තවද, 195 වගන්ති ප්‍රකාරව තැනැත්තා යන්නද අර්ථ දක්වා ඇත. ඒ අනුව, **"තැනැත්තා"** යන්නෙන්, පුද්ගලයකු හෝ අස්ථිත්වයක් අදහස් වන අතර, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්, පොල්ම:කරුවෙක්, රාජ්‍ය නොවන සංවිධානයක් සහ පුණ්‍යායතනයක් ඊට ඇතුලත් වේ.

නමුත් ඉහත අර්ථ දැක්වීමට රජය ඇතුලත් නොවේ. එබැවින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය රජයට ඇතුලත් ආයතනයක් වන බැවින්, රඳවා ගැනීමේ බදු අනුයෝජිතයා ලෙස ලියාපදිංචි වීම හෝ ගෙවීම් කිරීමේදී රඳවා ගැනීමේ බදු අඩු කල යුතු නැත.

එස්.එම්. වික්‍රමාරච්චි
කොමසාරිස් (ලේකම් අංශය)

එස්. එම්. වික්‍රමාරච්චි
කොමසාරිස්
ලේකම් අංශය
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව